# පොසොන් පණිවුඩය

මිහිඳු මාහිමියන් මිහින්තලා වෙදි දේවානම්පියතිස්ස නර නිඳුන්ට පමණක් පෞද්ගලිකව චූළහත්ථිපදොපම සූත්‍රය දේශනා කිරීමෙන් පසුව, ප්‍රථම වරට අනුරාධපුරයෙදි මහා ජනකායක් අමතා සිරිලක පොදු ජනතාවට දුන් මුල්ම පොසොන් පණිවුඩය අන්තර් ගත වන්නෙ ත්‍රිපිටකයෙ බුද්දක නිකායට අයත් විමානවත්ථු හා පෙතවත්ථු වලයි.

විමානවත්ථු වලින් කිය- වෙන්නෙ මෙලොවදි පින් කළ වුන් පරලොවදි දිව්‍ය සම්පත් විඳින සැටියි. පෙතවත්ථු වලින් කියවෙන්නෙ මෙලොවදි පව් කළවුන් පරලොවදි අපාගත වී දුක් විඳින සැටියි.

මිහිඳු මාහිමිසඳ මේ කථා වත්ථු කියාදීමෙන් කළේ මහින්දාගමනයට පෙර, තමන් ගෙ මියගිය අය හෙවත් මළ වුන් අදහමින්, ප්‍රාථමික ජීවිතයක් ගතකළ සිරිලක් වැස්සනට මළවුන් සම්බන්ධ හය-හතර කියාදී, ඔවුන් යහ මගට යොමු කිරීමයි.

හය හතර යනු කුමක්ද? හය හතර යන යෙදුම සිංහළ භාෂාවේ ඇතත් ඉන් අදහස් කරන්නේ කුමක්දැයි කියා බොහෝ දෙනා නොදන්නවා විය හැකියි. "හය හතර තේරෙන්නේ නැත". " හයක් හතරක් නොදන්නා මිනිස්සු " යනුවෙන් සමහරු සමහර විට තම කතාවෙහිදී කියතත් එහි සැබෑ තේරුම මෙයයි.

මෙහි හය නම් චාතුම්මහා රාජික, තාවතිංස, යාම, තුසිත නිම්මානරති, පරනිම්මිතවස වත්ති යන සදිව්‍ය ලෝකයන් නොහොත් දිව්‍ය ලෝක හයයි.

මෙහි දක්වෙන හතර නම් ප්‍රෙත, අසුර, තිරච්ඡාන, නෙරයික යන සතර අපායයි.

හයහතර දන්නේ නැත යන් නෙහි සැබෑ අරුත කෙනෙක් පින්පව් නොදන්නා බව කෙටියෙන් කීමයි.

අප පරලොවදි අපායකට හෝ දිව්‍ය ලෝකයකට යන්නෙ මෙලොවදිම අපායක හෝ දිව්‍ය ලෝකයක ජීවත්වෙන ආකාරය උඩයි. තමා කැමති දේ නැති කමින් පීඩා විඳවිඳ, ඒවාට ලෝභ කරමින් දුක්විඳින කෙනා මෙලො වදිම මානසික වශයෙන් ජීවත් වෙන්නෙ පෙරේතයෙක් වගෙයි.

කොච්චර වස්තු සම්පත් තිබුනත් තව තව මදි යයි, කිසිම සෑහීමකට පත් නොවී, දුක් විඳිනකෙනා ජීවත්වෙන්නෙ අසුර යෙක් වගෙයි. අසුරයව දක්වෙන් නෙ විශාල කල්දේරමක් තරම් බඩක් තිබුනත්, ඉඳිකටු මලක් තරම් උගුරක් තිබෙන නිසා මහ මුහුදෙ වැටුනත්, වතුර පොදක් නොපෙවී, පිපාසෙන් පීඩා විඳින සත්වයකු ලෙසයි. මෙලොවදි අතෘප්තිකර ආශාවන්ගෙන් පෙළි පෙළී චිත්ත පීඩා විඳිමින් ජීවත්වීමෙ ආදීනවය එයයි.

හැම දෙයක් ගැනම බියෙන් සැකයෙන් පෙළිපෙළී, තිරිසනෙක් වගෙ ජීවත්වෙන කෙනා මෙලො වෙදිම මානසික වශයෙන් ඉන්නෙ තිරශ්චීන නොහොත් තිරිසන් අපායකයි. හැම දේම නුරුස්සමින්, හැම දෙයකින්ම පිච්චි පිච්චි ජීවත්වෙන කෙනා



එදා පොසොන් දා මිහිඳුහිමියෝ දේවන පෑතිස් රජු තිසරණයෙහි පිහිටුවති

මෙලොවෙදිම මානසිකව ඉන්නෙ අවීචි මහ නරකාදියෙ ගින්දරෙන් පිච්චෙමින් දුක් විඳින නිරි සතෙක් වගෙයි.

මේ අනුව මෙලොවෙදි මානසිකව පෙරේතයෙක්ව ජීවත්වෙන කෙනා පරලොවදි උපදින්නෙ පෙරේතයෙක් වෙලයි.

අතෘප්තිකර ආශාවන්ගෙන් පෙළෙන කෙනා උපදින්නෙ අසුරයෙක් වෙලයි.

නිතරම බයෙන් සැකයෙන් ජීවත්වෙන කෙනා ඉපදෙන්නෙ තිරිසනෙක් වෙලයි.

හැමදෙයක්ම නුරුස්සන නිසා නිතරම පීඩාවෙන් පිච්චි පිච්චි ජීවත්වෙන කෙනා ඉපදෙන්නෙ නරකාදියෙ නිරි සතෙක් වෙලයි.

ඒ වුනත් පින් කරන අය මෙලොවත් පර ලොවත් සැපෙන් ඉන්නා බවයි ධම්මපදයෙ "ඉධ නන්දති පෙච්ච නන්දති කතපුඤ්ඤො" යන ගාථා පාඨයෙන් කියවෙන්නෙ.

♦ **සම්මානිත මහාචාර්‍ය**
**ටී. එස්. අබේවික්‍රම**
**Harrow UK**


Duke's Court Travel
DUKE'S COURT TRAVEL Travel Management

Fly to Colombo

| | | |
|---|---|---|
| SriLankan | SriLankan Airlines | fr £250 + Taxes |
| QATAR AIRWAYS | Qatar Airways | fr £230 + Taxes |
| KUWAIT AIRWAYS | Kuwait Airways | fr £245 + Taxes |
| Emirates | Emirates | fr £390 + Taxes |
| ETIHAD AIRWAYS | Etihad Airways | fr £173 + Taxes |
| OMAN AIR | Oman Air | fr £199 + Taxes |
| JET AIRWAYS | Jet Airways | fr £175 + Taxes |

**Note:** All fares mentioned are low season / terms & conditions apply.

020 8748 3535

ATOL 3045 PROTECTED · AITO THE ASSOCIATION OF INDEPENDENT TOUR OPERATORS · IATA

204 King Street, London W6 0RA


# අනුරාධපුරයේ අරින්නට යන සුරාසැලට සහ තැබෑරුමට සර්ව ආගමික විරෝධය



ශ්‍රීලංකා රජය අනුරාධපුරයේ විවෘතකිරිමට යන තැබෑරුමට සහ සුරාසැලට විරෝධය පාමින් අනුරාධපුර නගරයේ උද්ඝෝෂණයේ යෙදුණු භික්ෂූන් වහන්සේලා, ක්‍රිස්තියානි, හින්දු සහ මුස්ලිම් පූජකවරු ඇතුළු ජනතාව

බෞද්ධ පිළිවෙත් රකිමු යන තේමාව යටතේ 2600 සම්බුද්ධත්ව ජයන්තිය සැමරීමට ලෝක බෞද්ධ ජනතාව පෙළගැසෙමින් තිබුණු මොහොතේ දී ශ්‍රීලාංකීය ශාසන ඉතිහාසයේ ආරම්භය සටහන්වූත්, අධ්‍යාත්මික සංවර්ධනය, රෝග නිවාරණය සහ අධ්‍යාපනයේ කේන්ද්‍රස්ථානයක් වූත් ඓතිහාසික අනුරාධපුර නගරයේ අළුතෙන් ඉදි කෙරෙන මත්පැන් ගුදමට (අරක්කු තැබෑරුමට) සහ අනුරාධපුර වෙළඳ සංකීර්ණයේ විවෘත කෙරෙන මත්පැන් හලට අනුරාධපුර නාගරික ජනතාව දැඩි විරෝධය පළකර සිටිති.

මෙම මත්පැන් ගබඩා ඉදිකිරීම් නවතා දමන ලෙස අනුරාධපුර අටමස්ථානාධිපති සහ උතුරු මධ්‍යම දෙදිසාවේ ප්‍රධාන සංඝනායක පූජ්‍ය ආචාර්ය පල්ලේගම සිරිනිවාස හිමියන් හා රුවන්මැලි මහා සෑ චෛත්‍යාධිකාරී නුවර කලාවියේ ප්‍රධාන සංඝනායක පල්ලේගම හේමරතන යන නාහිමි වරුන්ද, අනුරාධපුරයේ ක්‍රිස්තියානි, හින්දු සහ මුස්ලිම් ආගම්වල ප්‍රධාන පූජකතුමන්ලාද එහි මහජනතාවද රජයෙන් ඉල්ලා සිටින මුත් ඒ කිසිවකට රජය ඊට ඇහුම් කන්දෙන බවක් පෙනෙන්ට නැත.

යෝජිත සුරාසැල හා තැබෑරුමට සමීපව ඇත්තේ ශ්‍රීමත් අනගාරික ධර්මපාල බෞද්ධ මධ්‍යස්ථානයයි. ඒ ළඟම අවන්ති දේවී බාලිකා පාසැලයි. යාබදව දරු දැරියන් 900 ක් දෙනා ඉගෙනුම ලබන විහාරමහාදේවී උපාසිකා- රාමයයි. ගුවන්විදුලියේ රජරට සේවය හා අනුරාධ පුර ශික්ෂණ රෝහලද ඒ අසලම ඇති නිසා මේ සියල්ලටම සිදුවන්නේ ඉතා විශාල කරදරයකි.

උතුරුමැද පළාතේ රදගුරු නෝබට් අන්ද්‍රාදි පියතුමා මෙසේ කීය.

" මත්පැන්හලක් මේ ප්‍රදේශයේ විවෘතකළොත් සදාචාරාත්මක පිරිහීමක් සිදුවෙන බව අප කවුරුත් දන්නා කාරණයක්. දරුවන් යහමගට ගැනීමට අවශ්‍යම කාලයක දෙමව්පියන් යහමගට ගැනීමට පුළුවන් වුනොත් විතරයි අපට දරු- වන් හරිමග යවන්න පුළුවන් වන්නේ. ඒනිසා මත්පැන් පානය කරනවා වගේම මත්පැන් හලක් ඇරීම මේ පළාතට කරන විශාල හානියක්. අරක්කු තැබෑරුමක් විවෘත කිරීම පවුල් අතර පවතින අර්බුද තවත් වැඩිකිරීමක්. "

මෙම මත්පැන් ශාලා විවෘතකිරීමට එරෙහිව භික්ෂූන්වහන්සේලා මෙන්ම මුස්ලිම් සහ හින්දු දේවස් ථානවල පූජකවරුන් ද දැඩි විරෝධය පාමින් අදහස් දක්වති. ශ්‍රීලංකාවේ ජනාධිපතිවරයා මැදහත්ව විශාල විනාශයකට පාර කපන මෙම සුරාගුදම් ඉදිකිරීම නවතා දමනවා ඇතියි අපේක්ෂා කරති.

**( දිවයින පත්‍රයෙනි )**


ඔබේ මුදල් අදම යවන්න - අදම ලබාගන්න

අප මත විශ්වාසය තබා, ලංකාවට මුදල් යවනා අපගේ දහස් ගනන් ගණුදෙනුකරුවන් ඔවුන් දුක් මහන්සියෙන් උපයාගත් මුදල්, ක්ෂණිකව සහ සුරක්ෂිතව එතෙර සිටින තම ආදරණීයන් වෙත ලබා දෙන්නේ හද පිරි සතුටෙනි.

* කොමර්ෂල්, හැටන් නැෂනල් සහ ලංකා බැංකු සමග එක්ව, දිවයින පුරා 500කට අධික ශාඛා ජාලයකින් එදිනම මුදල් ලබාගැනීමේ පහසුව
* ලංකාවේ ඕනෑම බැංකු ගිණුමකට මුදල් ක්ෂණිකව බැර කිරීම
* ඔබගේ NRFC / RFC විදේශ ගිණුම් වලට මුදල් බැර කිරීම
* රටවල් 120කට මුදල් යැවීමේ පහසුව
* ඔබගේ මුදල් මැද පෙරදිග අතරමැදියන් වෙත නොයා ක්ෂණිකව හා සෘජුවම ගිණුමට බැර කිරීමේ විශ්වාසය

FAST CASH
SEND TODAY - COLLECT TODAY

Transfer Fees From only £5

COMMERCIAL BANK · BOC BANK OF CEYLON · HNB · SEYLAN BANK LIMITED · NSB · HSBC · PEOPLE'S BANK · සම්පත් බැංකුව SampathBank · NDB bank · Standard Chartered

Strong. Safe. Reliable. MCG Mike Cooke Group
දින 7ම විවෘතයි

www.efastcash.biz
020 8886 4488
Head Office: 125-127 Bramley Road, Oakwood, London, N14 4UT